Australian Government
Australian Taxation Office

# ඔබේ බදු මුදල් ආපසු ලබා ගන්නා මේ කාල සීමාවේ දී සැළකිලිමත් විය යුතු කරුණු

බදු ආපසු ලබා ගන්නා මේ සමයේ දී බදු නියෝජිතයින් බව කියන හා සාවද්‍ය තොරතුරු ලබා දීමෙන් වැඩිපුර මුදලක් ආපසු ලබා ගත හැකි බවට වැරදි තොරතුරු ලබා දෙන අයගෙන් ප්‍රවේශම් වන්න.

### ඔබේ බදු නියෝජිතයා ලියාපංදිංචි අයෙකු බව සහතික කර ගන්න

ඔබ බදු නියෝජිතයකුගේ සහාය ලබා ගන්නේ නම් ඔවුන් Tax Practitioners Board හි ලියාපදිංචි වී ඇති බව සහතික කර ගන්න.

පරීක්ෂා කර බැලීම සඳහා **tpb.gov.au** වෙත යන්න.

ඔබේ බදු ආපසු ලබා ගැනීමේ කටයුතු සූදානම් කිරීම හා ඒවා යොමු කිරීම වෙනුවෙන් මුදලක් අය කළ හැක්කේ ලියාපදිංචිය සහිත බදු නියෝජිතයකුට පමණි.

### ඔබේ **myGov** ගිණුමේ ප්‍රවේශ තොරතුරු ලබා දෙන්න එපා

ඔබේ බදු නියෝජිතයාට බදු ආපසු ගැනීම් යොමු කිරීමට myGov ප්‍රවේශ තොරතුරු අවශ්‍ය නොවේ.

ඔබේ myGov ගිණුමේ ප්‍රවේශ තොරතුරු සෑම විට ම පෞද්ගලිකව තබා ගත යුතු අතර කිසිවකු සමග හුවමාරු කර ගැනීම නොකළ යුතුය.

ඔබ විසින් බදු නියෝජිතයකුගේ සේවය ලබා ගෙන ඇති විට පවා, ඔබේ බදු ආපසු ලබා ගැනීමේ තොරතුරු නිවැරදි බව තහවුරු කර ගැනීමට ඔබ වගකිව යුතු වන බව මතක තබා ගන්න.

### ඔබට බලපෑමක් සිදු වී ඇත්නම්

ඔබට බලපෑමක් සිදු වී ඇති බව සිතන්නේ නම්, ඔබේ තත්ත්වය ගැන සාකච්ඡා කිරීමට **13 28 61** ඔස්සේ ATO අමතන්න.

ඔබේ බදු නියෝජිතයාගේ කටයුතු සම්බන්ධයෙන් ඔබට ගැටලුවක් වේ නම් ඔබට Tax Practitioners Board වෙත වාර්තාවක් ඉදිරිපත් කළ හැකිය.

පැමිණිල්ලක් ගොනු කිරීමට **tpb.gov.au/make-complaint** වෙත යන්න.

### බදු ආපසු ලබා ගන්නා සමය සඳහා උපදෙස්

ඔබේ වියදම් ගැන සටහන් තබා ගන්නා බව තහවුරු කර ගන්න.

වෘත්තීයට අදාළ අඩු කිරීම් ලබා ගැනීම සඳහා:

- ඔබ තමා අතින් මුදල් වියදම් කර තිබිය යුතු අතර එසේ වැය වූ මුදල් ආපසු ලබා ගෙන නොතිබිය යුතුය
- එය ඔබගේ ආදායම් ඉපයීමට කෙළින් ම සම්බන්ධ විය යුතුය
- එය තහවුරු කිරීම සඳහා වාර්තා තිබිය යුතුය.

### ඔබ ගෙවූ බදු ආපසු ලබා ගැනීම යොමු කිරීම සඳහා උදව් අවශ්‍යද?

ඔබේ බදු ආපසු ලබා ගැනීම යොමු කිරීමට උදව් අවශ්‍ය නම්, ATO මගින් නොමිලේ පැවැත්වෙන Tax Help වැඩසටහන සඳහා ඔබට සුදුසුකම් තිබීමට ඉඩ ඇත. Tax Help වැඩසටහන සමහර ස්ථානවල දී ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවලින් පැවැත්වේ. වැඩිදුර තොරතුරු සඳහා **ato.gov.au/taxhelp** වෙත යන්න.

ඉංග්‍රීසි ඔබගේ මූලික භාෂාව නොවේ නම් උපකාර සඳහා **13 14 50** ඔස්සේ ATO හි Translating and Interpreting Service (TIS) අමතන්න.

ඉංග්‍රීසි නොවන වෙනත් භාෂාවලින් බදු පිළිබඳ විස්තර **ato.gov.au/otherlanguages** ද ඇතුළත් වේ.

myTax

වැඩිදුර තොරතුරු සඳහා **ato.gov.au/lodgmentsafety** වෙත යන්න

NAT 75226SIN-09.2019 DE-8892